ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல / MY NO: 4/1/එකුලේඛ    ඔබේ අංකය / உமது இல / YOUR NO:    දිනය / திகதி / DATE: 2015. 07. 22

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්),
පළාත් ඉඩම් කොමසාරිස්වරුන්.

<u>හිඟ ඉඩම් බදු මුදල් ගණනය කිරීම.</u>

රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබා දෙන බදු /අවසර පත්‍ර සඳහා හිඟ බදු මුදල් වර්තාකම ගණනය කිරීමේ දී එකිනෙකට වෙනස් ක්‍රමවේදයන් අනුගමනය කරන බව මා වෙත වාර්තා වී ඇත. මෙම විෂමතාවය මගහරවා ගැනීම සඳහා පහත පරිදි හිඟ බදු මුදල් වර්තාකම ගණනය කරන ලෙස කාරුණිකව දන්වමි.

02. යම් වර්ෂයක් සඳහා හිඟ බදු ගණනය කිරීමේ දී අදාල වර්ෂය සඳහා වාර්ෂික බදු වාරික මුදලත් දඩ හෝ පොලී අය කරන්නේ නම් අදාල වර්ෂය වන විට සමුච්චිත හිඟ බදු වාරික මුදල මත පොළියක් /දඩයක් අය කළ යුතුයි. මෙය තවදුරටත් පැහැදිලි කිරීම සඳහා පහත උදාහරණය බලන්න.

උදා :

වාර්ෂික බදු වාරිකය = රු. 2000/=
හිඟ මත අය කරන පොලිය = 10%
බද්ද ප්‍රදානය කළ දිනය = 2009.01.01

ප්‍රතිශෝධනය වන බදුකරයකි.

බදුකරු 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා බදු ගෙවා නොමැත. 2015.01.01 දින බදු ගෙවීමට පැමිණියේ නම් අය කරන සම්පූර්ණ මුදල ගණනය කිරීම.

| වර්ෂය | | බදු වාරිකය(රු.) | පොලිය(රු.) |
|---|---|---|---|
| 2010 | | 2000 | 2000 x 10/100 = 200 |
| 2011 | | 2000 | 4000 x 10/100 = 400 |
| 2012 | | 2000 | 6000 x 10/100 = 600 |
| 2013 | | 2000 | 8000 x 10/100 = 800 |
| 2014 | | 2000 | |
| | බදු ප්‍රතිශෝධනය නිසා බදු වැඩිවීම.(2000x50%) | + 1000 } 3000 | 11000 x 10/100 = 1100 |
| 2015 | | 3000 | |
| | | 14000 | = 3100 |

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2797400    ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2864051    වෙබ් ලිපිනය / இணையம் / Web Address: www.landcommdept.gov.lk    ඊමේල් / ஈ-மெயில் / E-mail: landcom@landcom

අය කරන හිඟ බදු වාරික මුදල = රු. 14,000.00
අය කරන හිඟ පොලී මුදල = රු. 3,100.00
2015.01.01 දින අය කරන සම්පූර්ණ මුදල = රු. 17,100.00

03. කෙසේ වුවද බදු අය කිරීමේ දී හිඟ බදු මුදල් ඇති නොවීමට වග බලා ගන්නා ලෙසත් අදාල බදු වාරික නියමිත වර්ෂවලදී අයකර ගැනීමටත් හැකි වන පරිදි කාර්යක්ෂම බදු අයකර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ගන්නා මෙන් දන්වමි. මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් මෙම දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (ගෙවීම්) (දු.ක. 0112797433) අමතන මෙන් ද දන්වමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.